පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.22 පැය 1550 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /807 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## වෙඩි තැබීමට තැත් කිරීමක් - කටුනායක පොලිස් වසම

2025.04.22 වන අද දින උදෑසන කාලයේ කටුනායක පොලිස් වසමේ ආඩිඅම්බලම දැවවෙට්ටාව ප්‍රදේශයේ නිවසකට යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු එම නිවසේ හිමිකරුට වෙඩි තැබීමට උත්සාහ කර ඇති අතර එහිදි ගිනි අවිය ක්‍රියාත්මක වී නොමැති වීම හේතුවෙන් සැකකරුවන් නිවසේ තාප්පයෙන් පැන පලාගොස් ඇති බවට ලද තොරතුරක් අනුව කටුනායක පොලිසිය විමශර්න ආරම්භ කර ඇත.

මෙහිදි එක් සැකකරුවෙකු තාප්පයෙන් පැනීමේදි අනතුරට ලක් වී තුවාල ලබා ඇති අතර ඔහු ප්‍රදේශවාසීන් විසින් අල්ලාගෙන පොලිසියට භාරදීමෙන් පසු ඔහු ප්‍රතිකාර සඳහා මීගමුව රෝහලට ඇතුලත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 33 ක් වූ අම්පාර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

වෙඩි තැබීමට රැගෙන ආ ගිනි අවිය හා යතුරු පැදිය පොලිස් භාරයට ගෙන ඇත. පලා ගිය සැකකරු අත්අඩංගුවට ගැනීමට කටුනායක පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**